Annexure 2.1.2.1a

# *Information Management in a Multi-literacy Environment*

## *Proceedings of the NILIS Research Symposium 2013*

**29th November 2013**

NILIS

*National Institute of Library & Information Sciences (NILIS),*

*University of Colombo,*

*Sri Lanka.*

## Contents....Contd.

යූ. ඩී. තිරුණි කාංචනා, පුස්තකාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, රත්මලාන. සහ ඩබ්. සෙනෙවිරත්න, පුස්තකාලයාධිපතිනි, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ — 83

සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා සහ තොරතුරු ගවේෂණ චර්යා: සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ඇසුරින් කරන ලද අධ්‍යයනයක්.
(Information needs and information searching behaviour of students in fine arts: a study at the University of Visual and Performing Arts)

**Lionel R. Amarakoon, Librarian, University of Bolton - WCMT Campus Sri Lanka and Sakunthala Kumari Amarakoon, University of Greenwich, London** — 95

Information Literacy and Higher Education: with special reference to University of Bolton, Academic Centre Sri Lanka

***Session 3***

<u>**Theme paper:**</u> **Mr. Upali Amarasiri, Director – NILIS** — 117

Open Access; Dawn of a New Era on Research and Librarianship in Sri Lanka

**Kamani Perera, Librarian, Regional Centre for Strategic Studies (RCSS)** — 121

Mobile Applications for Knowledge Discovery

**P.H.Nishantha Sampath, Lecturer, Department of Commercial Law, Fac. of Law** — 131

Copyright and freedom of expression: a Sri Lankan perspective

**Anusha Wijayaratne, Senior Assistant Librarian, Open University of Sri Lanka** — 133

Future of Document Delivery Services and Information Sharing Among Sri Lankan Libraries through OUSL Experience

***Session 4***

උදිත අලහකෝන්, සහකාර පුස්තකාලයාධිපති, ජාතික පුස්තකාල හා විඥාපන විද්‍යා ආයතනය — 149

මහජන පුස්තකාල විසින් සපයන ප්‍රජා තොරතුරු සේවා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

**Komathy Murugathas and Nadesamoorthy Thayaparan, Medical Library, University of Jaffna.** — 163

A study on the purchasing power of periodicals by the Medical Library, University of Jaffna during the period from year 2000-2012

ඩී.පී.ඩී.එස්. මල්කාන්ති, සහකාර පුස්තකාලයාධිපතිනි, වයඹ විශ්ව විද්‍යාලය — 175

ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තය ආශ්‍රිත තොරතුරු සන්නිවේදනය පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්
(An explorative study on information communication associated with the fisheries industry in Sri Lanka)

Annexure 2.1.2.1a



# සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා සහ තොරතුරු ගවේෂණ චර්යා: සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ඇසුරින් කරන ලද අධ්‍යයනයකි.

**යූ. ඩී. හිරුණි කාංචනා**
*පුස්තකාලය, වෘත්තීය තාක්ෂණ විශ්වවිද්‍යාලය, රත්මලාන.*
*udhkanchana@yahoo.com*

**ආචාර්ය ඩබ්. සෙනෙවිරත්න***
*පුස්තකාලය, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය, නාවල, නුගේගොඩ*
*Wathmanel.ousl@gmail.com*

## හැඳින්වීම

වර්තමාන සමාජය අඩු වැඩි වශයෙන් තොරතුරු පදනම් කරගත් සමාජයකි. ලොව පුරා ම තොරතුරු පරිභෝජනය වැඩි වශයෙන් සිදු වන අතර ඊට සාපේක්ෂව තොරතුරු බිහි වීමේ ප්‍රවණතාවක් ද දැක ගත හැකි ය. පුද්ගලයාගෙන් පුද්ගලයාට ඔවුන් වෙත පැන නගින තොරතුරු අවශ්‍යතා, අවස්ථානුකූලව විවිධ ස්වරූප ගනී. එමෙන් ම එක් එක් විෂය ක්ෂේත්‍රයන් අනුව ද තොරතුරු අවශ්‍යතා විෂමතා ප්‍රකට කරවයි. තොරතුරු අවශ්‍යතා සපුරා ගැනීමට යම් පුද්ගලයෙකු අනුගමනය කරන ක්‍රියාමාර්ග ඇසුරින් ගවේෂණ චර්යා යන සංකල්පය හඳුනාගත හැකි ය. ගවේෂණ චර්යාවන් ද පුද්ගලානුබද්ධව හා වෙනත් සාධක මත විවිධ වේ. එබැවින් තොරතුරු මධ්‍යස්ථානයන්ට හා ඒවායෙහි නියුක්ත වෘත්තිකයින්ට, පුස්තකාලයාධිපතිවරුන්ට ද එක් එක් පාඨක කණ්ඩායම්වල තොරතුරු අවශ්‍යතා හඳුනාගැනීම අතිශයින් වැදගත් වනු ඇත. පුද්ගල තොරතුරු අවශ්‍යතා පිළිබඳ අවබෝධයෙන් යුක්තව තොරතුරු සම්පාදනය කිරීම මගින් වඩාත් සාර්ථක තොරතුරු සේවාවක් ලබා දිය හැකි වේ. Zhang (1998) අවධාරණය කරන ආකාරයට ද සාර්ථක තොරතුරු සේවාවක් සැපයීම සඳහා පාඨකයාගේ තොරතුරු අවශ්‍යතා හා තොරතුරු ගවේෂණ චර්යාවන් ගැඹුරින් අවබෝධ කරගැනීම ප්‍රධාන අවශ්‍යතාවයකි. හඳුනාගත් සමාජ හෝ පුද්ගල කණ්ඩායම් හි තොරතුරු අවශ්‍යතා සහ ගවේෂණ චර්යා විමසා බැලීම පිණිස ජාතික හා අන්තර්ජාතික වශයෙන් සිදු කරන ලද අධ්‍යයනයන් රැසක් හමු වේ. නමුත් ශ්‍රී ලාංකේය අධ්‍යාපන පසුතලය තුළ සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ගවේෂණ චර්යා පිළිබඳව පර්යේෂකයින්ගේ අවධානය මෙතෙක් යොමුව නැත.

මානව සමාජයට සංවේදී මිනිසුන් බිහි කිරීමේ ලා සෞන්දර්ය කලා විෂය ක්ෂේත්‍රය මගින් ඉටුවන මෙහෙය සුළු කොට තැකිය නො හැක. සෞන්දර්යාත්මක ගුණය හෝ කලා රසය විඳගැනීමේ ශක්තිය ඇති සත්වයා මනුෂ්‍යයා සේ සැළකේ. මන්ද ඒ සඳහා මනසින් උසස් විය යුතු බැවිනි. පූර්වෝක්ත විෂය ක්ෂේත්‍රය බෙහෙවින් ප්‍රායෝගිකත්වයට නැඹුරු, විශේෂිත විෂය ක්ෂේත්‍රයක් බැවින් එය හදාරනු ලබන විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ගවේෂණ චර්යාවන් ද විශේෂිත විය හැකි ය. එවැනි පසුතලයක පිහිටා සිදු කරන ලද මෙම අධ්‍යයනය මගින් ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන් හි සෞන්දර්ය කලා

විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා සහ ගවේෂණ චර්යාවන් විමසීමට ලක් කෙරේ. ඒ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය ඇසුරිනි. මෙම අධ්‍යයනයේ දී සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා, ඔවුන්ගේ තොරතුරු ගවේෂණ චර්යා, ඔවුන් විසින් භාවිත තොරතුරු මූලාශ්‍ර හා මාධ්‍ය සහ ඔවුන් තොරතුරු ගවේෂණයේදී මුහුණපාන ගැටළු හඳුනාගනු ලැබ ඇත.

**අධ්‍යයනයේ අරමුණු**

මෙම අධ්‍යයනය පහත දැක්වෙන ප්‍රධාන අරමුණු තුන ඔස්සේ සිදු කරනු ලැබූයේ ඒ ඇසුරින් සකස් කරගත් විශේෂ අරමුණු ද අනුව ය. සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා හඳුනා ගැනීම, ඔවුන්ගේ තොරතුරු ගවේෂණ චර්යා පරීක්ෂා කර බැලීම, සෞන්දර්යය කලා විද්‍යාර්ථීන් තොරතුරු ගවේෂණයේ දී මුහුණ පාන ගැටළු හඳුනා ගැනීම ප්‍රධාන අරමුණු වේ.

**ක්‍රමවේදය**

මෙම පර්යේෂණය පවතින තත්වයක් පිළිබඳව විග්‍රහ කෙරෙන පර්යේෂණයකි. (Realistic) එබැවින් මෙම අධ්‍යයනය සිදු කිරීමට සමීක්ෂණ ක්‍රමවේදය (Survey Methodology) තෝරා ගනු ලැබිණ. මෙහි දී දත්ත රැස් කිරීමට ප්‍රශ්නාවලි ක්‍රමය තෝරා ගත් අතර නියැදිය සමඟ අවශ්‍ය පරිදි සාකච්ඡා කිරීම මගින් ද දත්ත රැස් කරනු ලැබ ඇත.

**සංගහනය සහ නියැදිය**

මෙම අධ්‍යයනයේ දී යොදාගත් සංගහනය වන්නේ සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයීය නර්තන හා නාට්‍ය කලා පීඨය, සංගීත පීඨය සහ දෘෂ්‍ය කලා පීඨය යන පීඨ ත්‍රිත්වයෙහි දෙවන, තෙවන හා සිව්වන වසරවල සමස්ත උපාධි අපේක්ෂක අපේක්ෂිකාවන් ය. එකී සමස්ත සංගහනය 1505 කි. නියැදිය වශයෙන් ඉහත සඳහන් කළ පීඨ ත්‍රිත්වයෙන් එනම් අනු ස්ථරායනයෙන් සියයට සංඛ්‍යාවක් ලබා ගන්නා ලදි. පීඨ ත්‍රිත්වයෙහි ම සමස්ත නියැදිය 180 ක් වේ.

**දත්ත විශ්ලේෂණය**

SPSS මෘදුකාංගය භාවිත කරමින් දත්ත විශ්ලේෂණය කරන ලදි. අවශ්‍ය වගු හා ප්‍රස්තාර ලබා ගැනීමේ දී අවශ්‍ය පරිදි Excel මෘදුකාංගය ද භාවිත කරනු ලැබිණ. සම්පූර්ණ කර ගන්නා ලද ප්‍රශ්නාවලියෙහි ඇතුළත් දත්ත අංකනය කර (code) පරිගණකයට ඇතළත් කරන ලදුව දත්ත විශ්ලේෂණය කරන ලදි. මෙහි දී Frequency, Descriptive statistics, Correlation, Chi-squre පරීක්ෂාවන් සිදු කර ඇත.

**සාහිත්‍ය ගවේෂණය**

සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ තොරතුරු අවශ්‍යතා සහ තොරතුරු ගවේෂණ චර්යා පිළිබඳව කරනු ලබන මෙම අධ්‍යයනය සඳහා අවශ්‍ය පසුබිම අවබෝධ කරගැනීම පිනිස පවතින සාහිත්‍යය, විමසා බැලීමේ දී මේ හා සම්බන්ධ වන සැළකිය යුතු මට්ටමේ සාහිත්‍යයක් පවතින බව පැහැදිලි විය. ඒ අනුව මාතෘකාව හා පර්යේෂණ අරමුණුවලට ගැලපෙන සේ තොරතුරු අවශ්‍යතා, විද්‍යාර්ථීන්ගේ

තොරතුරු අවශ්‍යතා, තොරතුරු ගවේෂණ චර්යා සහ තොරතුරු ගවේෂණ ගැටළු යන සංකල්ප යටතේ පර්යේෂණය සිදු කරන ලදී.

(Wikipedia, 2013) පවතින සාහිත්‍යයට අනුව තොරතුරු අවශ්‍යතා යනු, දැනුවත්ව හෝ නොදැනුවත්ව, තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා අවශ්‍යවන තොරතුරු සොයාගැනීමට ඇති කැමැත්ත යි.

Cowan (2004),කලාකරුවන්ගේ තොරතුරු අවශ්‍යතා සහ මූලාශ්‍ර පිළිබඳ කරන ලද අධ්‍යයනයක් පවතින සාහිත්‍යයෙන් හමු වේ. කලාකරුවන්ගේ කටයුතුවල ස්වභාවය ඔවුන්ගේ තොරතුරු ගවේෂණ චර්යාවන්ට හෝ සොයනු ලබන තොරතුරු කෙරෙහි බලපෑමක් ඇති කරන්නේද යන්න විමසීමට ලක් කර ඇත. ඔවුන්ගේ තොරතුරු ගවේෂණය පුස්තකාලයෙන් පරිබාහිරව ද සිදු වන බව ප්‍රතිඵල මගින් අනාවරණය වේ.

පවතින අධ්‍යයන ඇසුරු කොටගෙන කොබ්ලෙඩික් (Cobbledick, 1996)විසින් කලාකරුවන්ගේ තොරතුරු අවශ්‍යතා පහත සඳහන් පරිදි වර්ග පහකට බෙදා දක්වයි. උත්තේජනාත්මක තොරතුරු, විශේෂිත ද්‍රව්‍ය කලා තොරතුරු, තාක්ෂණික තොරතුරු, කලා ලොව තුළ ප්‍රවනතා සහ අවස්ථා පිළිබඳ තොරතුරු, ව්‍යාපාරික තොරතුරු යනුවෙනි.

Ajiboyeසහ Tella (2007),විද්‍යාර්ථීන්ගේ ප්‍රමුඛතම තොරතුරු අවශ්‍යතාවය වූයේ අධ්‍යයන තොරතුරු බව ප්‍රකාශ කරති. අනෙකුත් තොරතුරු අවශ්‍යතාවයන් ද පවතින නමුත් ඒවා අධ්‍යයන තොරතුරු තරම් ම වැදගත් නොවේ. තොරතුරු අවශ්‍යතා සහ ගවේෂණ චර්යා පිළිබඳ පර්යේෂණවල ආගමනයෙන් මෙම ක්‍රියාවලියෙහි විවිධ පියවර හඳුනාගැනීම සඳහා නොයෙක් ආකෘති (Models) යෝජනා විය. Kuhlthau (2013),තම අධ්‍යයනය ඇසුරෙහි තොරතුරු ගවේෂණ ආකෘතියක් ඉදිරිපත් කරනු ලබයි. එම ආකෘතියෙහි පියවර හයක් වේ. ඒවා නම්, ප්‍රවේශය, තේරීම, ගවේෂණය, සූත්‍රකරණය, එකතු කිරීම, ඉදිරිපත් කිරීම යනුවෙනි. Hemming (2007)පෙන්වා දෙන ආකාරයට කලාකරුවන් බොහෝ විට පුස්තකාල භාවිතය කෙරෙහි උනන්දුවක් නොදක්වන අතර ඔවුන්ගේ තොරතුරු ගවේෂණ ක්‍රියාවලිය නිර්මාණාත්මක කාර්යයන් හා සම්බන්ධ බව පැවසිය හැකි ය. ඔවුන්ට පුස්තකාලයෙන් තොරතුරු ගවේෂණයේ දී බොහෝ විට කිසිවෙකුගේ සහායක් අවශ්‍ය වේ. යම් යම් සමාජ ක්‍රියාකාරකම් හා සම්බන්ධ වීමෙන් ද ඔවුහු තොරතුරු ලබා ගනිති.

සාහිත්‍ය ගවේෂණය මගින් අනුගමනය කළ යුතු පර්යේෂණ ක්‍රමවේදය සහ ප්‍රශ්නාවලිය සකස් කළ යුතු ආකාරය පිළිබඳව අවබෝධය ද පර්යේෂණය සිදු කළ යුතු ආකාරය පිළිබඳව ද අදහසක් ලබාගත හැකි විය.

**ප්‍රතිඵල විශ්ලේෂණය හා සාකච්ඡාව**

තෝරාගත් නියැදියෙහි ප්‍රතිචාර මට්ටම 100% කි. සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් තම උපාධිය සඳහා හදාරනු ලබන විෂයයන්ගෙන් වැඩි විෂය ප්‍රතිශතයක් ප්‍රායෝගික විෂයයන් ය. 93% ක ප්‍රතිශතයක් ඒ බව සනාථ කරනු ලැබ ඇත.

**තොරතුරු අවශ්‍යතා**

ඔවුන්ගේ වෙත පවතින ප්‍රධානතම විෂයානුබද්ධ තොරතුරු අවශ්‍යතාවය වන්නේ විභාග සඳහා සූදානම් වීමට අවශ්‍ය තොරතුරු පිළිබඳ අවශ්‍යතාවය යි. එමෙන් ම විෂයානුබද්ධ තොරතුරු අවශ්‍යතාවයන් අතර නිර්මාණකරණයේ යෙදීමට අවශ්‍ය තොරතුරු ද ඉතා වැදගත් කොට සලකා ඇත. එය 60% ක ප්‍රතිශතයකි. ඔවුන්ට හැදෑරීමට සිදුව ඇති ප්‍රායෝගික විෂය ප්‍රමාණය වැඩි බැවින් නිර්මාණ කාර්යයන්හි නිරත වීම ද විෂයානුබද්ධ අවශ්‍යතාවයක් බැවින් එසේ වන්නට ඇත. මෙම විෂයානුබද්ධ අවශ්‍යතාවය සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ට පවතින විශේෂිත තොරතුරු අවශ්‍යතාවයක් සේ සැළකිය හැකි වේ. මන්ද යත් වෙනත් විෂය ක්ෂේත්‍රයන්ට අයත් විද්‍යාර්ථීන් අතර නිර්මාණකරණයේ යෙදීමට අවශ්‍ය තොරතුරු පිළිබඳ අවධානයක් පවතින බව සාහිත්‍ය විමසුමේ දී දැකගත නොහැකි වූ බැවිනි.

ප්‍රසංග පැවැත්වීමට අදාල තොරතුරු වැදගත් සේ සලකනු ලැබ ඇති අතර පීඨය අනුව එය වෙනස් වේ. සංගීත පීඨයට එය වැඩි වශයෙන් අවශ්‍ය වන නමුත් දෘෂ්‍ය කලා පීඨයට අඩු අගයක් ගනු ලබයි. කයි වර්ග (chi-square) පරීක්ෂාවට අනුව ද P අගය 0.01 ට වඩා අඩු බැවින් ප්‍රසංග පැවැත්වීමට අදාල වන තොරතුරු පීඨය මත වෙනස් වන බව තවදුරටත් පැවසිය හැකි ය. ප්‍රායෝගික තොරතුරු අවශ්‍යතා අතර ප්‍රමුඛත්වය හිමි වන්නේ ප්‍රායෝගික විෂය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතාවයන් පිළිබඳ තොරතුරු සඳහා ය. දේශීයව හා විදේශීයව පවතින නිර්මාණ පිළිබඳ තොරතුරු සහ ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කරගත හැකි මාර්ග පිළිබඳ තොරතුරු දෙවනුවට හා තෙවනුවට වැදගත් සේ සළකා ඇත.

පර්යේෂණ තොරතුරු අවශ්‍යතාවයන් විමසා බලන ලද අතර එහි දී පර්යේෂණයට අදාල වන තොරතුරු ඉතා වැදගත් සේ සලකනු ලැබේ. එය 77% ක ප්‍රතිශතයකි. සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ වෙනත් තොරතුරු අවශ්‍යතා අතර ප්‍රමුඛ වන්නේ රැකියා අවස්ථාවන් පිළිබඳ තොරතුරු ය. දෙවනුවට වෘත්තීය පුහුණු අවස්ථා පිළිබඳ තොරතුරු වැදගත් වන අතර අවම අගයක් හිමි කරගනු ලබන්නේ වැඩමුළු සම්බන්ධ තොරතුරු ය. විද්‍යාර්ථීන්ට, උපාධිය ලබා ගැනීමෙන් පසු තමාට නියුතු විය හැකි රැකියා පිළිබඳව උනන්දුවක් පවතී. සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් හදාරනු ලබන ඇතැම් පාඨමාලා සෘජුවම කිසියම් වෘත්තියකට සම්බන්ධ වන බව මෙම අධ්‍යයනයේ දී හඳුනාගත් කරුණු අනුව පැහැදිලි වේ. ඔවුහු තම දැනුම් මට්ටම අනුව තමාට නිරත විය හැකි රැකියා අවස්ථා පිළිබඳව උනන්දුව දක්වති.

**තොරතුරු ගවේෂණ චර්යා**

සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ ජනප්‍රියතම තොරතුරු ගවේෂණ මාර්ගය වන්නේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ සාකච්ඡා කිරීම යි. ඔවුන් හදාරනු ලබන වැඩි විෂය ප්‍රමාණයක් ප්‍රායෝගික විෂයයන් බැවින් මෙම ක්‍රියාමාර්ගය කෙරෙහි වැඩි නැඹුරුවක් පවතින බව සිතිය හැකි ය. ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය භාවිතය හා පුස්තකාල භාවිතය ද තොරතුරු ගවේෂණ මාර්ග වේ. සිනමා නිර්මාණ/ නාට්‍ය/ රූපවාහිනී මාධ්‍ය නැරඹීම, නාට්‍ය හා රංග කලාව හදාරනු ලබන විද්‍යාර්ථීන් වඩාත් කැමැත්තක් දක්වන ගවේෂණ මාර්ගයකි. ශාන්තිකර්ම/ප්‍රදර්ශන/ සන්දර්ශන නැරඹීම ද ඒවාට ශිල්පීන් වශයෙන් සහභාගී වීම ද යන ගවේෂණ මාර්ග අඩු ප්‍රතිචාර මට්ටමක් පෙන්නුම් කරනුයේ එවැනි ගවේෂණ මාර්ග නිරන්තරවම

අනුගමනය කළ නොහැකි නිසාවෙන් විය හැකි ය. මන්ද ශාස්ත්‍රීය/ප්‍රායෝගික/ සන්දර්ශන නිර්මාණයක නොයැවුණිශත අතර ගැටළුවෙන් ද ඒ සඳහා යොමු වීමට වෙනම කාලයක් ගත කළ යුතු වේ. එමෙන් ම ප්‍රතිචාර මට්ටමට අනුව විද්‍යාර්ථීන් වැඩි පිරිසක් කාන්තාවන් වීම ද වැදගත් ගවේෂණ මාර්ග නිරන්තරයෙන් අනුගමනය නොකිරීමට හේතුවක් විය හැකි ය. මෙහි සඳහන් හෝ වෙනත් ගවේෂණ මාර්ග, සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ට විශේෂිත වූ ඒවා සේ සැලකිය හැකි වේ.

විද්‍යාර්ථීන් පුස්තකාල ඇසුරින් තොරතුරු ගවේෂණය කරනු ලබන ආකාර පිළිබඳව විමසා බැලීමේ දී වැඩි වශයෙන් ම භාවිත කරනු ලබන ක්‍රමය වන්නේ පොත් රාක්ක වෙත ම ගොස් තොරතුරු ලබා ගැනීම යි. 70% ක් එය නිරන්තරවම සිදු කරති. පුස්තකාල කාර්ය මණ්ඩලයේ සහාය ලබා ගැනීම දෙවනුව වැඩි අගයක් ගන්නා ක්‍රමවේදය වේ. සූචි පත්‍රිකා සහ අනුක්‍රමණිකා භාවිතය අවම මට්ටමක පවතී.

සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් තොරතුරු ගවේෂණය කරන ආකාරය පීඨයට අනුව වෙනස් වේද යන්න පරීක්ෂා කරන ලදී. එහි ප්‍රතිඵලයට අනුව P අගය 0.016 වේ. ඒ අනුව එක් එක් පීඨය අනුව විද්‍යාර්ථීන් තොරතුරු ගවේෂණයෙහි යෙදෙන ආකාරය වෙනස් වන බව පැවසිය හැකි ය. එක් එක් පීඨයන් හි පවතින් විෂයයන් අනුව තොරතුරු ගවේෂණය කිරීම තනි තනිව ද, කණ්ඩායම් වශයෙන් ද යන්න තීරණය වන බව සිතිය හැකි වේ.

නැරඹීම මඟින් තොරතුරු ගවේෂණය ජනප්‍රියතම චර්යාව වශයෙන් හඳුනා ගැනිණි. 65% ක් නිරන්තරයෙන් මෙම චර්යාව අනුගමනය කරනු ලබන බවට ප්‍රතිචාර දක්වා ඇති අතර 29% ක් සාමාන්‍යයෙන් භාවිත කෙරේ. ප්‍රායෝගික විෂය ක්ෂේත්‍රයක් වන සෞන්දර්ය කලා විෂයයන් හැදෑරීමේ දී විද්‍යාර්ථීන්ට බොහෝ විට තොරතුරු ලබා ගැනීමට සිදු වන්නේ නැරඹීම මඟිනි. රංගනයක්, නර්තනයක්, මූර්ති, චිත්‍ර, වෙනත් කලා නිර්මාණයක් දෙස බලා සිටීමෙන් ඔවුහු තොරතුරු ලබා ගනිති. මෙය සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ට පවතින විශේෂිත ගවේෂණ චර්යාවක් සේ සැලකිය හැකි ය. සවන් දීම, සටහන් කර ගැනීම, අදාළ අවස්ථාවන් සඳහා සහභාගි වීම ද ගවේෂණ චර්යාවන් වශයෙන් අනුගමනය කරනු ලබති.

ප්‍රවීන/ පාරම්පරික ශිල්පීන් වෙතින් තොරතුරු ගවේෂණය කරනු ලබන බවට විද්‍යාර්ථීන් 84% ක් පිළිතුරු ලබා දී ඇත. එනම් ඔවුන් බහුතරයක් ප්‍රවීන හෝ පාරම්පරික ශිල්පීන් වෙතින් තොරතුරු ගවේෂණය කරනු ලබන බව යි. කයි වර්ග පරීක්ෂාවෙන් ද ඒ බව තහවුරු විය. සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් පාරම්පරික/ ප්‍රවීන ශිල්පීන් වෙතින් තොරතුරු ගවේෂණය කරනු ලබන සුලබ ක්‍රමවේදය වන්නේ ශිල්පීන් විසින් කරනු ලබන කාර්යයන් නිරීක්ෂණයෙනි.

### තොරතුරු මූලාශ්‍ර

සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් තම තොරතුරු අවශ්‍යතා සපුරාගැනීමෙහි ලා වැඩි වශයෙන් භාවිත තොරතුරු මූලාශ්‍රය වන්නේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ය. පොත් යනු දෙවනුවට වැදගත්වන මූලාශ්‍රය යි. සමකාලීන මිතුරයින්, විෂය ප්‍රවීනයින්, ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍ය මූලාශ්‍ර ආදිය ද විද්‍යාර්ථීන් අතර ප්‍රචලිතව පවතින තොරතුරු මූලාශ්‍රයන් වේ. එමෙන් ම තමා ලබන අත්දැකීම් ද ඔවුන්ගේ තොරතුරු මූලාශ්‍ර බවට පත් වේ. ඒවා තම නිර්මාණ කාර්යයන්ට මූලාශ්‍ර කොට ගනු ලබති.

### තොරතුරු ගවේෂණ ගැටළු

භාෂාමය ගැටළු යනු විද්‍යාර්ථීන්ට පවතින ප්‍රබලතම ගවේෂණ ගැටළුව යි. තොරතුරු මූලාශ්‍රයන්ගේ හිඟකම දෙවනුවට බලපාන ගැටළුව වශයෙන් ද තෙවනුවට පවතින ගැටළුව වශයෙන් තොරතුරු ගවේෂණයට කාලය ප්‍රමාණවත් නොවීම ද සඳහන් කළ හැකි ය. සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් වැඩි වශයෙන් කැමැත්ත දක්වනුයේ සිංහල භාෂාවෙන් තොරතුරු ගවේෂණය කිරීමට ය. එබැවින් වෙනත් භාෂාවන්ගෙන් පවතින තොරතුරු ගවේෂණය ඔවුන්ට ගැටළු ඇති කරවන බව සිතිය හැකි ය. මෙහි දී විද්‍යාර්ථීන් දක්වන ලද අදහස් අනුව නවීන තාක්ෂණික උපකරණ නොමැති වීම ද ගවේෂණ ගැටළුවකි.

ප්‍රවීන/ පාරම්පරික ශිල්පීන් වෙතින් තොරතුරු ගවේෂණයේ දී මුහුණ පාන ගැටළු අතර ප්‍රමුඛ වන ගැටළුව වශයෙන් විද්‍යාර්ථීන් සඳහන් කරනුයේ ශිල්පීන් වෙතින් තොරතුරු ලබා ගැනීමට බොහෝ කාලයක් ඔවුන් ඇසුරෙහි ගත කිරීමට සිදු වීම යි. ශිල්පීන් තමා සතු තොරතුරු ලබා දීමට ඇති අකමැත්ත දෙවනුවට බලපාන ගැටළුව වශයෙන් හඳුනාගත හැකි වේ. මෙම දත්ත සනාථ කෙරෙන කරුණු රැසක් විද්‍යාර්ථීන් සමඟ කළ සම්මුඛ සාකච්ඡා මඟින් ද අනාවරණය කරගත හැකි විය. එනම්, පාරම්පරික ශිල්පීන් වෙතින් තොරතුරු ලබා ගැනීමට ඔවුන් හමුවීමට කිහිප වරක් ම යාමට සිදු වීම, එසේ වැඩි කාලයක් ගත කළ ද අවශ්‍ය පරිදි තොරතුරු ලබාගත නොහැකි වීම, ප්‍රවීන ශිල්පීන් වුව ද කාර්ය බහුල වීම, ආර්ථික දුෂ්කරතා වැනි හේතූන් මත ඇතැම් ශිල්පීන් අදාල විෂය ක්ෂේත්‍රය අත්හැර වෙනත් ක්ෂේත්‍රවලට යොමු වී සිටීම, ඒ මඟින් ඔවුන් සතු පාරම්පරික දැනුම අමතක වීම, ඔවුන් සතු පැරණි අත්පිටපත් නිසි පරිදි සංරක්ෂණය කිරීමක් සිදු නොකිරීමෙන් ඒවාට හානි පැමිණ තිබීම ආදිය යි. මේවා සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ට තොරතුරු ගවේෂණයේ දී බාධාවන් ඇති කරවන කරුණු වේ. සෞන්දර්ය කලා විෂය ක්ෂේත්‍රයෙහි බොහෝ ප්‍රවීන / පාරම්පරික ශිල්පීන් සතු දැනුම ඔවුන්ගේ දෙවන පරම්පරාව විසින් ඉදිරියට ගෙන නොයන අවස්ථාවල දී හසල දැනුමැති ශිල්පීන්ගේ හිඟය මතු වේ. මෙවැනි තත්වයක් යටතේ සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ට ඉතා වැදගත් තොරතුරු ගවේෂණ චර්යාවක් වන ප්‍රවීන/ පාරම්පරික ශිල්පීන් ඇසුරෙහි තොරතුරු ගවේෂණයේ දී ගැටළු රැසකට මුහුණ පෑමට සිදු වේ.

### නිගමන සහ යෝජනා

සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් උපාධි සඳහා හදාරනු ලබන විෂයයන්ගෙන් වැඩි ප්‍රමාණයක් ප්‍රායෝගික විෂයයන් වේ. විභාග සඳහා සූදානම් වීමට අවශ්‍ය තොරතුරු යනු විද්‍යාර්ථීන් අතර වැඩිම ප්‍රතිචාර ලද විෂයානුබද්ධ තොරතුරු අවශ්‍යතාවය යි. ඊට අමතරව දේශනවලට අදාල තොරතුරු, අන්තර්ජාතිකව සිදු කෙරෙන නව නිර්මාණ පිළිබඳ තොරතුරු, විෂය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා පිළිබඳ තොරතුරු, නිර්මානකරණයේ යෙදීමට අවශ්‍ය තොරතුරු, ප්‍රසංග පැවැත්වීමට අවශ්‍ය තොරතුරු, පවතින ප්‍රසංග/ ප්‍රදර්ශන/ ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු, ආදී විෂයානුබද්ධ තොරතුරු අවශ්‍යතා පවතී. මෙම තොරතුරු අවශ්‍යතා සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ට පවතින විශේෂිත අවශ්‍යතා ලෙස සැලකිය හැකි ය. ඔවුන්ගේ විෂය ක්ෂේත්‍රය ප්‍රායෝගිකත්වයට වැඩි නැඹුරුවක් දක්වන බැවින් මෙවැනි

තොරතුරු අවශ්‍යතා පවතින බවට නිගමනය කළ හැකි වේ. ඔවුහු උපාධියට අදාලව ප්‍රායෝගික නිර්මාණකරණයේ යෙදිය යුතු අතර ඒ සඳහා පවතින තොරතුරු අවශ්‍යතා අතර ප්‍රායෝගික විෂය ක්ෂේත්‍රයේ නව ප්‍රවනතා පිළිබඳ තොරතුරු ප්‍රමුඛ වේ.

විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සමඟ සාකච්ඡා කිරීම, සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් අතර ජනප්‍රියතම තොරතුරු ගවේෂණ මාර්ගය වේ. පුස්තකාල පරිහරණය, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය භාවිතය, ශාන්තිකර්ම/ ප්‍රසංග/ ප්‍රදර්ශන නැරඹීම හා ඒවාට ශිල්පීය දායකත්වය සැපයීම, සම්මන්ත්‍රණ/ වැඩමුළු සඳහා සහභාගීත්වය, අන්තර්ජාල භාවිතය, කලා කෘති අධ්‍යයනය ඔවුන්ගේ අනෙකුත් තොරතුරු ගවේෂණ මාර්ග කිහිපයක් ලෙස හඳුනාගත හැකි ය.

සෞන්දර්ය කලා විද්‍යාර්ථීහු තනි තනිව තොරතුරු ගවේෂණයට වැඩි කැමැත්තක් දක්වති. කණ්ඩායම් වශයෙන් තොරතුරු ගවේෂණය ද සිදු වන නමුත් එය එතරම් ප්‍රබල නොවනුයේ ශාන්තිකර්ම/ ප්‍රදර්ශන ආදියට සහභාගී වීම, නාට්‍ය නැරඹීම, සාමූහික නිර්මාණවල යෙදීම ආදි කණ්ඩායම් ක්‍රියාකාරීත්වයන් නිරන්තරව සිදු නොවන බැවින් විය හැකි ය. මෙම තත්වය එක් එක් පීඨය අනුව වෙනස්කම් පෙන්වයි.

ඔවුන්ගේ තොරතුරු ගවේෂණ චර්යා විශේෂත්වයක් පෙන්නුම් කරන අතර නැරඹීම මගින් තොරතුරු ගවේෂණයට වැඩි නැඹුරුතාවයක් දක්වයි. ඊට අමතරව සවන් දීම, සටහන් කර ගැනීම, අදාල අවස්ථා සඳහා සහභාගීත්වය, ප්‍රායෝගික දායකත්වය සැපයීම වැනි චර්යාවන් ද පෙන්නුම් කරනු ලබති. ඔවුන්ට පවතින ප්‍රායෝගික තොරතුරු අවශ්‍යතා මෙවැනි ගවේෂණ චර්යාවන් සඳහා මග පෙන්වන බව සිතිය හැකි වේ.

සෞන්දර්ය කලා විද්‍යාර්ථීහු ප්‍රවීන/ පාරම්පරික ශිල්පීන් වෙතින් තොරතුරු ගවේෂණය කරනු ලබති. ඒ සඳහා වැඩි වශයෙන් අනුගමනය කරන චර්යාව වන්නේ ශිල්පීන් විසින් කරනු ලබන කාර්යයන් නිරීක්ෂණය යි. නිවෙස්වලට ගොස් ඔවුන් සමඟ සාකච්ඡා කිරීම, නිර්මාණ කටයුතු වලට දායක වීම නිරන්තරව සිදු නොවේ. සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් වැඩි ප්‍රතිශතයක් කාන්තාවන් බැවින් නිවෙස්වලට ගොස් සාකච්ඡා කිරීම නිරන්තරව සිදු නොවන බව සිතිය හැකි ය.

විද්‍යාර්ථීහු භාවිත ජනප්‍රියතම තොරතුරු මූලාශ්‍රය වන්නේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ය. පොත්, ශ්‍රව්‍ය දෘශ්‍ය මාධ්‍ය මූලාශ්‍ර, විෂය ප්‍රවීනයින්, සමකාලීන මිත්‍රයින්, තමා ලබන අත්දැකීම් ඔවුන් ට වැදගත් වන තොරතුරු මූලාශ්‍ර වශයෙන් සලකති. ඔවුන්ගේ ප්‍රායෝගික තොරතුරු අවශ්‍යතා සපුරාගැනීමෙහි ලා බොහෝ විට භාවිත කරනුයේ අවිධිමත් මූලාශ්‍ර බව පැහැදිලි වේ. තොරතුරු ගවේෂණයට වඩාත් කැමති භාෂා මාධ්‍යය සිංහල භාෂාව යි.

තොරතුරු ගවේෂණ ගැටළු අතර භාෂාමය ගැටළුව ප්‍රමුඛ වේ. එය වසර අනුව වෙනස් වේ. ප්‍රවීන/ පාරම්පරික ශිල්පීන් වෙතින් තොරතුරු ගවේෂණයේ දී තොරතුරු ලබා ගැනීමට එම ශිල්පීන් ඇසුරෙහි බොහෝ කාලයක් ගත කිරීමට සිදු වීම ප්‍රධානතම ගැටළුව යි. එම ශිල්පීන් තොරතුරු ලබා දීමට ඇති අකමැත්ත ද ප්‍රබල ගැටළුවකි. බොහෝ විට පාරම්පරික ශිල්පීන් සතු තොරතුරු වෙනත් කිසිදු මූලාශ්‍රයකින් ලබාගත නොහැකි ය. ඔවුන් තොරතුරු ලබා දීමට අකමැති වීමෙන්, එම තොරතුරු ඔවුන් සමඟම අභාවයට යාම කණගාටුවට කරුණකි.

අධ්‍යයනයට අනුව සෞන්දර්ය කලා විද්‍යාර්ථීන් වෙත විශේෂිත තොරතුරු අවශ්‍යතා පවතින බව ත් ඊට සාපේක්ෂව ඔවුහු විශේෂිත තොරතුරු ගවේෂණ චර්යා පෙන්නුම් කරනු ලබන බවත් හඳුනාගත හැකි ය. ඔවුන්ගේ තොරතුරු අවශ්‍යතා සඳහා සාමාන්‍ය විද්‍යාර්ථීන් පරිශීලනය කරනු ලබන තොරතුරු මූලාශ්‍ර පමණක් ප්‍රමාණවත් නොවේ. මන්ද යත්, එය විශේෂිත විෂය ක්ෂේත්‍රයක් වන අතර එහි ලා විද්‍යාර්ථීන් ලබනුයේ නිබඳව ප්‍රායෝගිකව පුහුණු විය යුතු දැනුමකි. පුහුණුවෙන් හා ප්‍රායෝගික භාවිතයෙන් තොරව සෞන්දර්ය කලා විෂයයන් හි ප්‍රවීනත්වයක් ලැබීම උගහට ය.

සෞන්දර්ය කලා විද්‍යාර්ථීන්ගේ විශේෂිත තොරතුරු අවශ්‍යතා සහ ගවේෂණ චර්යාවන්ට ගැලපෙන සේ පුස්තකාල සේවාවන් සංවර්ධනය වීම සහ ආයතනික වශයෙන් ඒ සඳහා අවශ්‍ය පසුබිම සකස් කර දීම සුදුසු බවට යෝජනා කළ හැකි ය. බහු මාධ්‍ය මූලාශ්‍ර භාවිතය සහ ශිල්පීය ඇසුර විද්‍යාර්ථීන්ට වැඩි වශයෙන් ලබා දීම සුදුසු වේ. නිදහස් හා වැඩි ඉඩ පහසුකම් සහිත පරිසරයක් තිබීම ද වැදගත් විය හැකි ය.

**ආශ්‍රිත මූලාශ්‍ර**

Ajiboye, J. O. and Tella, A. (2007). University undergraduate students' information seeking behavior : Implications for quality in higher education in Africa, *The Turkish online journal of education technology*, Vol.6, Iss. 1, Retrieved January 10, 2013 from http://www.eric.ed.gov/PDFS/ED500071.pdf

Cobbledick, Susie (1996), The information seeking behavior of Artists: Exploratory interviews, *Library Quarterly*, Vol. 66, No. 4, pp. 343-372, Retrieved January 05, 2013 from http://www.eric.ed.gov/ERICWebPortal/search/detailmini.jsp?_nfpb=true&_&ERICExtSearch_SearchValue_0=EJ532864&ERICExtSearch_SearchType_0=no&accno=EJ532864

Cowan, S. (2004), Informing Visual Poetry: Information needs and sources of Artists, *Art Documentation*, Vol. 32, No. 2, pp. 14-20, Retrieved January 20, 2013 from http://courses.washington.edu/mlis510/fall07/Cowen%20Article.pdf

Hemming, W. S. (2007), The information seeking behavior of visual artists: A literature review, *Journal of documentation*, Vol. 64, No. 3, pp. 343-362, Retrieved January 12, 2013 from Emerald database.

Kuhlthau, C. C. (2013), *Information Search Process*, Online Retrieved April 08, 2013 from http://comminfo.rutgers.edu/~kuhlthau/information_search_process.htm

Wikipedia the free encyclopedia (2013). *Information needs*. Retrieved February 10, 2013 from http://en.wikipedia.org/wiki/Information_needs

Zhang, W.(1998). Analyzing Faculty and Staff's Information Needs and Use of Electronic Technologies: A Liberal Arts College's Perspective. *Journal of educational media and library science*, Vol. 35, No. 03, pp. 218-241, Retrieved 01. 05, 2013 from http://www.fed.cuhk.edu.hk/en/jemls/199800350003/0218.htm

---

**Ms. U D Hiruni Kanchana**



Ms. Hiruni Kanchana is currently working as an Assistant Librarian at the University of Vocational Technology, Sri Lanka. She holds a Bachelor Degree and a Diploma in Library and Information Science.

**Dr (Mrs.) Wathmanel Seneviratne**



Dr (Mrs.) Wathmanel Seneviratne is the Librarian at the Open University of Sri Lanka. She holds a BA, Diploma in Library and Information Science, MLS and PhD from University of Colombo. Dr (Mrs.) Wathmanel possess memberships of ASLLA and ACILIP.

Annexure 2.1.2.1b

# National Institute of Library and Information Sciences (NILIS)
## University of Colombo, Sri Lanka

*NILIS Research Symposium* – 2013

on 29th November 2013

Theme : 'Information Management in a Multi-literacy Environment'

Venue: National Institute of Library and Information Sciences (NILIS)
University of Colombo

This is to certify that

**Ms. U.D. Hiruni Kanchana**

Presented a research paper titled

*Information needs and information searching behavior of students fine arts: a study at the University of Visual and Performing Arts*

at the above symposium

Upali Amarasiri
Director
National Institute of Library & Information Sciences
University of Colombo
44, Cumaratunga Munidasa Mw.
Colombo 03

.............................................
Upali Amarasiri
Chair, Organizing Committee
Director/NILIS

29th November 2013